# ව්‍යාපාර පදනම

| |
|---|
| ව්‍යාපාර = කර්මාන්ත + වාණිජ්‍ය |

| |
|---|
| වාණිජ්‍ය = වෙළඳාම + උපකාරක සේවා |

- **මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු "ව්‍යාපාර" ලෙස හඳුන්වයි.**

- **කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේ සිට අවසන් පාරිභෝගිකයා අතට පත්වීම දක්වා වූ ක්‍රියාවලිය වාණිජ්‍ය ලෙස හඳුන්වයි.**

<u>අවශ්‍යතා සහ වුවමනා</u>

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| මිනිසාට ජීවත් වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරාගත යුතු කායික හා මානසික තත්වයන් ය. | අවශ්‍යතා සපුරා ගත හැකි විවිධ ආකාර වේ. |
| සීමිතයි. | අසීමිතයි. |
| පොදුයි. | විවිධයි. |
| ප්‍රාථමිකයි. | ද්විතිකයි. |
| අත්‍යවශ්‍යයෙන්ම ඉටු කරගත යුතුය. | අත්‍යවශ්‍ය නොවේ. |

<u>නිෂ්පාදිත</u>

**මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වෙළඳපලට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිතයක් ලෙස හඳුන්වයි. පටු වර්ගීකරණයේදී "භාණ්ඩ හා සේවා" ලෙස වර්ග කරන අතර පුළුල් වර්ගීකරණයේදී භාණ්ඩ, සේවා, අදහස්, ස්ථාන, ඉසව්, ක්‍රියාකාරකම්, පුද්ගලයන්, සංවිධාන, තොරතුරු ආදී වශයෙන් වර්ග කරයි.**

| භාණ්ඩ | සේවා |
|---|---|
| ස්පර්ශ කල හැකියි. | ස්පර්ශ කල නොහැකියි. |
| නිෂ්පාදකයාගෙන් වෙන් කල හැක. | නිෂ්පාදකයාගෙන් වෙන් කල නොහැක. |
| ගබඩා කල හැකිය. | ගබඩා කල නොහැකිය. |
| සමජාතියයි. | විෂමජාතියයි. |

<u>වෙළඳපල</u>

**කිසියම් භාණ්ඩයක්, සේවයක්, අදහසක් හෝ තොරතුරක් සමබන්ධයෙන් ගැනුම්කරුවන් හා විකුනුම්කරුවන් අතර සම්බන්ධතාවක් ඇති වන ඕනෑම තත්වයක් වෙළඳපල ලෙස හඳුන්වා දිය හැකිය.**

## ව්‍යාපාර ගතිලක්ෂණ

**1. විකිණුම් හෝ හුවමාරුවීම් සිදු වීම.**

සෑම ව්‍යාපාරයක්ම භාණ්ඩ හා සේවා මුදල්මය අගයක් මත විකිණීම හෝ හුවමාරු කිරීම සිදු කරයි. උදාහරණ වශයෙන් පවුලේ අය සඳහා ආහාර පිසීම ව්‍යාපාරයක් නොවන අතර කිසියම් මිලකට වෙනත් අයට විකිණීම සඳහා ආහාර පිසීම ව්‍යාපාරයකි.

**2. භාණ්ඩ හා සේවා ගනුදෙනු වීම.**

සෑම ව්‍යාපාරයක්ම අන් අයට විකිණීම සඳහා භාණ්ඩ හෝ සේවා නිපදවීම හෝ මිලදී ගැනීම සිදු කරයි.

**3. ගනුදෙනු අඛණ්ඩව සිදු වීම.**

අඛණ්ඩ පදනමක් මත දිගින් දිගටම භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු කරයි නම් එය ව්‍යාපාරයකි. උදාහරණ වශයෙන් තම භාවිතට තිබූ මෝටර් රථය විකිණීම ව්‍යාපාරයක් නොවන නමුත් දිගින් දිගටම මෝටර් රථ විකිණීම සිදු කරයි නම් එය ව්‍යාපාරයකි.

**4. ලාභයෙන් අභිප්‍රේරණය වීම.**

ව්‍යාපාරයක වර්ධනය සහ ප්‍රසාරණය සඳහා ලාභය අත්‍යවශ්‍ය වේ.

**5. අවදානමක් පැවතීම.**

ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාව හා අලාභ සිදු වීමට ඇති ඉඩකඩ නිසා ව්‍යාපාරයක් පවත්වාගෙන යාම අවදානම් සහගතය. පාරිභෝගික රුචිය වෙනස්වීම, ස්වභාවික බලපෑම්, තාක්ෂණික බලපෑම්, රජයේ අණපනත් හා නීතිරීති, තරඟ කාරිත්වය ඉහළ යාම, ගිනිගැනීම්, සොරසතුරු උවදුරු, ආර්ථික අස්ථාවරභාවයන් ආදිය අවධානම් සඳහා උදාහරණ වේ.

**6. වුවමනා නිර්මාණය කිරීම.**

භාණ්ඩ නිපදවීමත් සේවා සැපයීමත් ඔස්සේ ව්‍යාපාර විසින් මිනිස් වුවමනා නිර්මාණය කරයි.

**7. ආර්ථික කටයුත්තක් වීම.**

හිඟ සම්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා නිපදවීමත් බෙදාහැරීමත් සිදු කරන නිසා ව්‍යාපාරයක් යනු ආර්ථික කටයුත්තකි.

## ව්‍යාපාර කටයුතු

සෑම ව්‍යාපාරයක් විසින්ම සිදු කරන ප්‍රධාන කාර්යයන් දෙකකි. එනම්,

**1. මිනිස් අවශ්‍යතා සහ වුවමනා ඉටු කිරීම.**

මිනිස් අවශ්‍යතා හටගන්නේ මානව උප්පත්තිය සමඟ වන අතර මෙම අවශ්‍යතා සපුරා ගැනීම මිනිසාට තනිවම කල නොහැකි නිසා අවශ්‍යතා වෙනුවෙන් වුවමනා සපුරාලීමට භාණ්ඩ හා සේවා නිපදවමින් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලන්නේ ව්‍යාපාර විසිනි.

**2. සම්පත් වලට අගය එකතු කිරීම.**

භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී යොදා ගනු ලබන සම්පත් වල ස්වරූපය වෙනස් කරමින් සම්පත් වලට අගය එකතු කිරීම ව්‍යාපාර විසින් සිදු කරයි.

## <u>ව්‍යාපාර අරමුණු</u>

- වෙළඳපල තුළ රැඳී සිටීම
- ලාභ උපරිම කිරීම
- සමාජ සුභසාධනය
- විකිණුම් උපරිම කිරීම
- වෙළඳපල කොටස වැඩි කර ගැනීම
- අයිතිකරුවන්ගේ පුද්ගලික තෘප්තිය
- සේවක සුභසාධනය
- පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම

## <u>ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාර වල දායකත්වය.</u>

- මිනිස් වුවමනා සපුරාලීම
- සේවා නියුක්තියට දායක වීම
- නවෝත්පාදනය
- සමාජ සුභසාධන කටයුතු සිදුකිරීම
- ඇල්මැති පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලබා දීම

## <u>ව්‍යාපාර විකාශනය</u>

**භාණ්ඩ හුවමාරු යුගය**

- අතීතයේ පැවති ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය ඔස්සේ ඍජු නිෂ්පාදනය තුලින් විශේෂීකරණය බිහිවූ අතර ඒ නිසා බිහිවූ අතිරික්ත නිෂ්පාදනය එකිනෙකා අතර හුවමාරු කර ගත් යුගය "බාටර් යුගය" ලෙස හැඳින්විණි. මේ හේතුවෙන් වෙළදාම බිහි විය. එනම් වක්‍ර නිෂ්පාදනය යි.

**මුදල් භාවිතය**

- භාණ්ඩ හුවමාරු යුගයේ පැවති දුර්වලතා මග හරවා ගැනීමට අතරමැදියෙකු වශයෙන් මුදල් භාවිත කරන ලදී. මුල්කාලීනව ද්‍රව්‍ය මුදල්ද, පසුව ලෝහ වර්ග, ලෝහ කාසි භාවිතයේ සිට වර්තමාන ව්‍යවහාර මුදල්, විද්‍යුත් මුදල් දක්වා මෙය විකාශනය වී ඇත.

**කාර්මික විප්ලවය**


- 18 වන සියවස තුළ ඇති වූ කාර්මික විප්ලවයත් සමග උපකාරක සේවා වල වර්ධනය වීමත්, මහා පරිමාණ කර්මාන්ත බිහි වීමත් සිදු වූ අතර එය ව්‍යාපාර වල ශීඝ්‍ර සංවර්ධනයකට හේතු විය

**තොරතුරු යුගය**

- විද්‍යුත් වාණිජ්‍ය හා විද්‍යුත් ව්‍යාපාර පදනම් කරගෙන ක්‍රියාත්මක වන වර්තමාන යුගයයි.

## ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා


- විද්‍යුත් ව්‍යාපාර
  සමස්ථ ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය හරහා සිදු කිරීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හඳුන්වයි.
- විද්‍යුත් මුදල් භාවිතය.
  - ණයපත්, හරපත්, පෙරගෙවුම් කාඩ්පත් භාවිතය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතියි.
- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
- සමාජ වගකීම් සංකල්පය ගැන අවධානය යොමු වීම.
- ගෝලීයකරණය
  ලෝකයේ රටවල් ඒකාබද්ධ වීම, ආර්ථිකයට වඩා විවෘත වීම හා රටවල් අතර අන්තර්රැදියාව වර්ධනය කර ගැනීම මගින් ලෝකයම සමීප වීම ගෝලීයකරණයයි.




## ව්‍යාපාර වර්ගීකරණය

| | |
|---|---|
| 1. පරිමාව අනුව | ▪ සුළු හා මාධ්‍ය පරිමාණ<br>▪ මහා පරිමාණ |
| 2. අයිතිය අනුව | ▪ රාජ්‍ය අංශය<br>▪ පෞද්ගලික අංශය |
| 3. නිෂ්පාදන ස්වාභාවය අනුව | ▪ ප්‍රාථමික<br>▪ ද්විතියික<br>▪ තෘතියික |
| 4. නිෂ්පාදන අංශ අනුව | ▪ කෘෂි<br>▪ කාර්මික<br>▪ සේවා |
| 5. අරමුණ අනුව | ▪ ලාභ අරමුණු කරගත්<br>▪ ලාභ අරමුණු කර නොගත් |

ව්‍යාපාරයක යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය





ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව

ව්‍යාපාරයක් කෙරෙහි අවධානයෙන් සිටින හෝ ව්‍යාපාරයෙන් යමක් අපේක්ෂා කරන පාර්ශ්වයන් ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව ලෙස හඳුන්වයි.

| | |
|---|---|
| ▪ අයිතිකරුවන්<br>ලාභය<br>වෙළඳපල කොටස<br>ව්‍යාපාරයේ වර්ධනය<br>ව්‍යාපාරයේ පැවැත්ම | ▪ කළමනාකරුවන්<br>ලාභය<br>ගත් තීරණ වල සාර්ථක අසාර්ථක බව<br>ව්‍යාපාරයේ වර්ධනය<br>උසස්වීම් ලබා ගැනීම |
| ▪ සේවකයන්<br>ඉහළ වැටුපක් ලබා ගැනීම<br>උසස්වීම ලබා ගැනීම<br>රැකියා සුරක්ෂිතතාව<br>ප්‍රසාද දීමනා | ▪ තරඟකරුවන්<br>ප්‍රවර්ධන උපක්‍රම<br>වෙළඳපල කොටස |
| ▪ රජය<br>බදු අය කරගැනීමට<br>ආර්ථික සංවර්ධනයට දායකත්වය<br>සහනාධාර ලබා දීම<br>සේවා නියුක්තිය වර්ධනය කිරීම | ▪ ප්‍රජාව<br>රැකියා අවස්ථා<br>ප්‍රජා සේවා<br>පරිසර හානි අවම කර ගැනීම |
| ▪ පාරිභෝගිකයෝ<br>ගුණාත්මක භාණ්ඩ/සේවා ලබා ගැනීම<br>වගකීම් නිසි පරිදි ඉටු කිරීම `<br>සාධාරණ මිලට භාණ්ඩ ලබා ගැනීම<br>අඛණ්ඩව භාණ්ඩ/සේවා ලබා ගැනීම | ▪ ණයහිමියෝ<br>මුදල් ආපසු ලබා ගැනීම<br>ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය<br>ණය මුදලේ සුරක්ෂිත බව<br>පොළී අය කර ගැනීම |

<u>ව්‍යාපාර පරිසරය</u>




අභ්‍යන්තර පරිසරය යනු ව්‍යාපාරය තුළ සිටින ව්‍යාපාරයට ඍජුව බලපෑම් කරන කණ්ඩායම් සහ තත්වයන් වේ.

ව්‍යාපාරයට පාලනය කල නොහැකි සාධක ඇතුළත් පරිසරය භාහිර පරිසරයයි. මෙය ආසන්න පරිසරය සහ සාර්ව පරිසරය ලෙස ප්‍රධාන කොටස් දෙකකි.

ආසන්න පරිසරය යනු අභ්‍යන්තර පරිසරය තරම් බලපෑමක් කල නොහැකි නමුත් ව්‍යපාරයට සැලකිය යුතු බලපෑමක් කරන පරිසරයයි.

සාර්ව පරිසරය යනු ව්‍යාපාරයට කිසිසේත්ම පාලනය කල නොහැකි, එහෙත් ව්‍යපාරයට බලපෑම් සිදු කරන පරිසරයයි.

- ❖ මෙහිදී ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යනයෙන් ව්‍යාපාරයේ ‘‘ශක්තීන්’’ හා ‘‘දුර්වලතා’’ ද, භාහිර පරිසරය අධ්‍යනයෙන් ව්‍යාපාරයට පවතින ‘‘අවස්ථා’’ හා ‘‘තර්ජන’’ හඳුනා ගත හැකිය.

අභ්‍යන්තර පරිසරය සතු ශක්තීන් සහ දුර්වලතා

| | ශක්තීන් | දුර්වලතා |
|---|---|---|
| අයිතිකරුවන් | ▪ වැඩි සංඛ්‍යාවක් සිටීම<br>▪ හොද මූල්‍ය ශක්තියක් තිබීම<br>▪ වැඩි දැනුම හා පළපුරුද්දක් තිබීම. | ▪ අඩු සංඛ්‍යාවක් සිටීම.<br>▪ මූල්‍ය ශක්තිය අඩු වීම.<br>▪ අඩු දැනුම හා පළපුරුද්ද |
| කළමනාකරුවන් | ▪ පුහුණුව හා පලපුරුද්ද වැඩි වීම<br>▪ නිවැරදි තීරණ ගැනීම | ▪ අඩු පළපුරුද්දක් පැවතීම<br>▪ වැරදි තීරණ ගැනීම<br>▪ තීරණ ගැනීමට පසුබට වීම |
| සේවකයන් | ▪ දක්ෂ, පළපුරුදු සේවකයන් සිටීම<br>▪ යහපත් ආකල්ප පැවතීම<br>▪ අභිප්‍රේරණය වූ සේවකයන් සිටීම<br>▪ පක්ෂපාති වීම | ▪ නුපුහුණු සේවකයන් සිටීම<br>▪ වගකීමෙන් හා වගවීමෙන් තොර වීම<br>▪ ඍණ ආකල්ප සහිත වීම<br>▪ අකාර්යක්ෂම සේවකයින් සිටීම |
| සංවිධාන සංස්කෘතිය | ▪ ප්‍රබල හර පද්ධතියක් තිබීම<br>▪ හොද ඇගයීම් පද්ධතියක් පැවතීම<br>▪ ධන ආකල්ප දැරීම<br>▪ මිත්‍යා විශ්වාස, මත නොමැති වීම<br>▪ දියුණු චර්යාධර්ම පද්ධතියක් තිබීම. | ▪ දුර්වල හර පද්ධතියක් තිබීම<br>▪ ඇගයීම් පද්ධතියක් ක්‍රියාත්මක නොවීම<br>▪ ඍණ ආකල්ප දැරීම<br>▪ මිත්‍යා විශ්වාස, මත බහුල වීම<br>▪ හොද චර්යාධර්ම පද්ධතියක් ස්ථාපිත නොවීම |
| සංවිධාන සම්පත් | ▪ නවීන හා යාවත්කාලීන වූ සම්පත් පැවතීම<br>▪ ප්‍රමාණාත්මකව පැවතීම<br>▪ නිසි පරිදි නඩත්තු කරන ලද සම්පත් සහිත වීම | ▪ යල්පැනගිය සම්පත් සහිත වීම<br>▪ සම්පත් ඌනතාව<br>▪ අතිරික්ත සම්පත් පැවතීම<br>▪ නිසි ලෙස නඩත්තු නොකරන ලද සම්පත් පැවතීම |
| සංවිධාන ව්‍යුහය | ▪ මනා වැඩ පරිසරයක් සහිත වීම<br>▪ සම්බන්ධීකරණය පහසු වීම<br>▪ බලතල හා වගකීම් සාම්‍ය බව<br>▪ උචිත පරිදි වැඩ බෙදා තිබීම | ▪ වැඩ පරිසරය අවුල් සහගත වීම<br>▪ සම්බන්ධීකරණය අපහසු වීම<br>▪ බලතල හා වගකීම් සාම්‍ය නොවීම<br>▪ වැඩ බෙදා තිබීම දුර්වල වීම |

## සාර්ව පරිසරයේ අවස්ථා හා තර්ජන

- දේශපාලන පරිසරය

රජයේ නියෝජිත ආයතන, රජයේ දේශපාලන දර්ශනය, ආර්ථික ප්‍රතිපත්ති ඔස්සේ ව්‍යාපාරවලට අවස්ථා සහ තර්ජන හටගනියි.

- නෛතික පරිසරය

රජයේ අණපනත්, නිතිරිති ආදිය ව්‍යාපාර වලට තර්ජන මෙන්ම අවස්ථා උදා කරයි.

- ආර්ථික පරිසරය

මිල මට්ටම, උද්දමනය, පොළී අනුපාතය, සේවා නියුක්තිය, ජීවන මට්ටම වැනි ආර්ථික සාධක ව්‍යාපාර කෙරෙහි හිතකර මෙන්ම අහිතකර අයුරින්ද බලපායි.

- සමාජ සංස්කෘතික පරිසරය

පුද්ගලයන් තුළ පවත්නා අගනාකම්, විශ්වාස, වටිනාකම්, සිරිත්විරිත්, ආගමික විශ්වාස, සාරධර්ම ආදිය සමාජ සංස්කෘතික පරිසරයට අයත් වේ.

- තාක්ෂණික පරිසරය

සන්නිවේදන, ප්‍රවාහන, කෘෂිකාර්මික ආදී විවිධ ක්ෂේත්‍ර වල ඇති වන තාක්ෂණික වෙනස් වීම මෙම පරිසරයට ඇතුළත් වන අතර මෙම තාක්ෂණික පරිසරය ආශ්‍රයෙන් අවස්ථා මෙන්ම තර්ජනද හට ගනියි.

- ප්‍රජා පරිසරය

ව්‍යාපාර සමග සම්බන්ධ වන ප්‍රධානම සාධකයකි, ජනගහනය. මෙම පරිසරය යටතට ජනගහන ප්‍රමාණය, ජනගහන වර්ධන වේගය, වයස් මිශ්‍රය, ස්ත්‍රී-පුරුෂ බව, අධ්‍යාපන මට්ටම්, ජනවාර්ගික සංයුතිය, පවුල් සංයුතිය, ගෘහ රටා ආදිය අයත් වේ.

- ස්වාභාවික පරිසරය

සම්පත් හිඟ කම, නව සම්පත් සොයා ගැනීම, දේශගුණික වෙනස්කම්, පරිසර දූෂණය, ස්වාභාවික විපත් ආදී සාධක මීට අයත් වෙයි.

- ගෝලීය පරිසරය

ගෝලීයකරණය, ගෝලීය වෙළඳපල, වෙළඳ ගිවිසුම්, වෙළඳ හවුල්, ලෝක සංවිධාන, අන්තර්ජාතික නීතිරීති ව්‍යාපාර වලට අවස්ථා මෙන්ම තර්ජන ඇති කරයි.

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”